# 1 වාරය

## විෂය.- සිංහල සාහිත්‍ය සංග්‍රහය

## ශ්‍රේණිය 11

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය අධ්‍යයන ඉලක්ක - සබරගමු පළාත් පාසල් - 2019

**විෂය.- සිංහල සාහිත්‍ය සංග්‍රහය** **වාරය. 1** **ශ්‍රේණිය 11**

| අනු අං | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | පැය ගණන කාලච්ඡේද | පැවරුම් හා විෂය භාහිර ක්‍රියාකාරකම් | තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න පත්‍ර | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණ සඳහා යොමු කිරීම | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | 13.0 සාහිත්‍ය ඉතිහාසය අර්ථාවබෝධය හා අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි. | 13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි. | | 1<br>මි.40 | පොළොන්නරු යුගයේ සාහිත්‍ය කෘති පිළිබඳව තොරතුරු එක්රැස් කරයි.අමාවතුර කෘතිය පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරයි. | 1. අමාවතුර කෘතියේ කතුවරයා කවු ද?<br>2. එය රතචිත යුගය සඳහන් කරන්න.<br>3. අමාවතුර කෘතියෙන් ඔබට නියමිත පෙළ පොතේ දී ඇති කතා වස්තුව කුමක් ද?<br>4. කෘතියේ ඇති වෙනත් දමන කතා දෙකක් ලියන්න.<br>5. අමාවතුර කෘතියේ කතුවරයාගේ අරමුණ ලියන්න. | ප්‍රශ්නෝත්තර<br>නිරීක්ෂණ<br>බුද්ධි කලම්බන | අමාවතුර කෘතිය | | පුස්තකාලය පරිහරණය කරමින් පොළොන්නරුව සාහිත්‍ය යුගයේ බිහිවූ විවිධ සාහිත්‍ය ග්‍රන්ථ නාමාවලියක් පිළියෙල කරන්න |
| | | | | 2<br>පැ 1 මි 20 | අහිංසක කුමරුගේ උපතේ සිට ගුරු පූජාවට උපදෙස් ලබා දෙන අවක්ථාව දක්වා කතා පුවත ලිහිල් බසින් ලියයි. | කතාව කියවීමෙන් ඔබ අනාවරණය කරගත් සමාජිය තොරතුරු කෙටියෙන් විස්තර කරන්න.<br>දී ඇති පදවල අර්ථය ශබ්ද කෝෂය භාවිත කොට සොයන්න.<br>•ධර්මාන්තේවාසික ව<br>•බැණැ බනගන්නාහු<br>•අටවියටඅජන්මවතැ<br>•පරසන්තාන දමනය<br>•පුළුවුත්තෙන්<br>•පිළිදගුව<br>"මහරජ නොබව, මාගේ ගෙහි කුමරෙක් උපන.උහුගෙ ආනුභාවයෙන් තොපගෙ මතුනොවෙයි සියලු නුවර ආයුධ දිලිණැ"<br>මෙම ප්‍රකාශයේ අවස්ථා සම්බන්ධය ලියන්න. | ප්‍රශ්නෝත්තර | අමාවතුර කෘතිය | සාහිත්‍ය විද්‍යාව | අමාවතුර කෘතිය කියවා එහි එක් කතා වස්තුවක් සරල බසින් ලියන්න. |

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය අධ්‍යයන ඉලක්ක - සබරගමු පළාත් පාසල් - 2019

**විෂය.-** සිංහල සාහිත්‍ය සංග්‍රහය     **වාරය. 1**     **ශ්‍රේණිය 11**

| අනු අං | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | පැය ගණන කාලච්ඡේද | පැවරුම් හා විෂය භාහිර ක්‍රියාකාරකම් | තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න පත්‍ර | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණ සඳහා යොමු කිරීම | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 1<br>මි 40 | පිටුව 72 හි ඇතුළත් කරුණු ලිහිල් බසින් ලියයි. | 1 විශ්වාස කළ නොහැකි යයි කියන සිව් දෙනා නම් කරන්න.<br>2. ගම් වැසියන් තම දරුවන් රැගෙන පිට ගම් කරා ගියේ ඇයි?.<br>3. කෙතරම් දරුණු වුවද මවකට තම දරුවා ඉතාම වටී. මන්තානි බැමිණිය කෙරේ තිබූ මාතෘත්වය කෙබඳු ද යන්න නිදසුන් සහිතව විස්තර කරන්න. | පැවරුම්<br>සාකච්ඡා<br>ප්‍රශ්නෝත්ත<br>ර<br>සංකල්ප<br>සිතියම | අමාවතුර කෘතිය දුරවබෝධ වචනවල අර්ථය ලියූ පුවරුවක් | අමාවතුර කෘතිය | ඇඟිලි රැස් කරමින් ගම් දනව් සිසාරා ඇවිද අහිංසක කුමරුගේ ක්‍රියාව ඔබ දුටුවේ යයි සිතන්න ඒ පිළිබඳව තම යහළුවන්ට කරන විස්තරය ලියන්න. |
| | | | | 1<br>මි .40 | පිටුව 73 හි ඇතුළත් කරුණු ලිහිල් බසින් ලියයි. | මියෙහි කෙළ සිඳී ගියෙ.<br>ශරීරයෙන් ස්වේද බස්සී මෙම වැකි දෙක සරල බසින් ලියන්න.<br>දානයෙහි ආනිසංස කියැවෙන ප්‍රකාශයක් උපුටා ලියන්න<br>"මෙතැනදී මොහු හඹා යමි" මෙය කවුරුන් විසින් කිනම් අවස්ථාවක කාහට කරන ලද ප්‍රකාශයක් ද? | පැවරුම්<br>සාකච්ඡා<br>ප්‍රශ්නෝත්ත<br>ර<br>සංකල්ප<br>සිතියම | අංගුලිමාල දමනය ඇතුළත් රූප සටහනක් | අමාවතුර කෘතිය | |
| | | | | 1<br>මි .40 | සාහිත්‍ය සංග්‍රහය 74 පිටුවෙහි ඇතුළත් කොටස කියවා<br>අර්ථාවබෝධය ඉදිරිපත් කරයි<br>චරිත විචාරයෙහි යෙදෙයි. | "පුත මා හා බෙණෙහි නෙබෙණෙහි" මෙහි අර්ථය ලියන්න<br>මාගෙ රට අඟුල්මල් නම් සොරෙකැ,උහු ගන්නට යෙමි මෙම ප්‍රකාශයෙහි අවස්ථා සම්බන්ධය ලියන්න | පැවරුම්<br>සාකච්ඡා<br>ප්‍රශ්නෝත්ත<br>ර<br>සංකල්ප<br>සිතියම | | අමාවතුර කෘතිය | බුදු රජාණන් වහන්සේ සහ අංගුලිමාල සොරු අතර ඇති වූ සංවාදයක් නිර්මාණය කරන්න. |
| | | | | 1<br>මි .40 | සාහිත්‍ය සංග්‍රහය 75 පිටුවෙහි ඇතුළත් කොටස කියවා<br>අර්ථාවබෝධය ඉදිරිපත් කරයි<br>චරිත විචාරයෙහි යෙදෙයි. | අටල්ලට,කිහඹියකු,අභිර ත, කුලගම්,මූඪගර්භ, කෙණෙසි, යන වචනවල අර්ථය ලියන්න.<br>75 පිටුවේ ඇති කොටස සරල බසින් ලියන්න. | පැවරුම්<br>සාකච්ඡා<br>ප්‍රශ්නෝත්ත<br>ර<br>සංකල්ප<br>සිතියම | අංගුලිමාල දමනය ඇතුළත් රූප සටහනක් | අමාවතුර කෘතිය | ගුරුවරයාගේ වැරදි මග පෙන්වීම නිසා අසරණ වූ අංගුලිමාල ඔබ නම්ඔබේ සිතට ඇතිවන හැඟීම් ලියන්න<br>ඔබ කිසියම් සභාවක දී ඔබගේ අත්දැකීම් පිළිබඳව ඉදිරිපත් කරන කතාව පංතියට ඉදිරිපත් කරන්න. |

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය අධ්‍යයන ඉලක්ක - සබරගමු පළාත් පාසල් - 2019

**විෂය.-** සිංහල සාහිත්‍ය සංග්‍රහය　　　　**වාරය. 1**　　　　**ශ්‍රේණිය 11**

| අනු අං | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | පැය ගණන කාලච්ඡේද | පැවරුම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න පත්‍ර | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණා සඳහා යොමු කිරීම | ප්‍රායෝගික පරීක්ෂණා හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | සාහිත්‍ය සංග්‍රහය 76 පිටුවේ ඇතුළත් කොටස දෙබස් කර ඉදිරිපත් කරන්න. | අධිවාසනා,ආපාතයට, සස්තෙපුල්,වලප්නා, කෙළ දරුවන්, අතවැසි, යන පදවල අර්ථය ලියන්න. | සාකච්ඡා | අමාවතුර කෘතිය | සිංහල සාහිත්‍යය 1 -ආනන්ද කුලසූරිය<br>සිංහල සාහිත්‍ය වංශය - පුංචි බන්ඩාර සන්නස්ගල<br>සිංහල සාහිත්‍යය 2- -ආනන්ද කුලසූරිය<br>සිංහල කතා කලාවේ විකාශනය | අඟුල්මල් දමනය කතාව නාට්‍යයක් ඇසුරින් ඉදිරිපත් කරන්න. |
| 2 | 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 13.1 නිර්දිෂ්ට සාහිත්‍ය කෘතිවල සාහිත්‍ය ලසුබිම ගවේෂණය කරයි. | | 2<br>පැ 1 මි 20 | දඹදෙණි ාහිත්‍ය යුගයේ ලියවුණු සාහිත්‍ය ග්‍රන්ථ හා ඒවායේ තොරතුරු ඇතුළත් ගොණුවක් සකසන්න.(පුස්තකාලය පරිශීලනය කරන්න) | සද්ධර්ම රත්නාවලිය යන්න අර්ථ දක්වන්න.<br>සද්ධර්ම රත්නාවලියකතුවරයාගේ අරමුණ පහදන්න.<br>සද්ධර්ම රත්නාවලිය කතුවරයාගේ ස්වාධීන කෘතියක් බව තහවුරු කෙරෙන ප්‍රකාශයක් උපුටා ලියන්න. | | | | සද්ධර්ම රත්නාවලිය කෘතියේ එන නෙත් කතා වස්තු 10 ක නම් ලියන්න එක කතා වස්තුවක් පන්තියට ඉදිරිපත් කරන්න. |
| | | 13.2 නිර්දිෂ්ට සාහිත්‍ය කෘතිඅවබෝධයෙන් යුතුව කියවා අර්ථය ඉදිරිපත් කරයි. | | පැය 2 යි | සද්ධර්ම රත්නාවලිය කතුවරයාගේ කතා කලාවේ ලක්ෂණයකි සංවාදශීලී බස්වහර එයට උදාහරණ පෙළ පොත ඇසුරින් සපයන්න. | පාලි කතා වස්තු මුල් කොට ගෙන සිංහලෙන් කතා කීමේ ශෛලිය හඳුන්වන රීතිය නම් කරන්න.<br>සද්ධර්ම රත්නාවලිය කතුවරයාගේ කතා ශෛලියේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ නම් කරන්න.<br>එක් එක් ලක්ෂණයට නිදසුන් එක බැගින් සපයන්න. | ප්‍රශ්නෝත්තර ක්‍රමය සාකච්ඡා ක්‍රමය | සද්ධර්ම රත්නාවලිය පොත හා පෙළ පොත ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය | ” ” | පිටු අංක 80 - 81 හි ඇතුළත් කතාව සඟා සුදුසු දෙබසක් නිර්මාණය කරන්න.<br>නාටක විද්දත් දියණියගේ හපන්කම් ඔබ දුටුවේ යයි සිතන්න. ඒ පිළිබඳ ව දුර පළාතක සිටින ඔබගේ මිතුරෙකු වෙත යවන ලිපියක් ලියන්න. |
| | | 13.3 නිර්දිෂ්ට කතාවේ අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කරයි. | | පැ 1 මි 20 | සද්ධර්ම රත්නාවලිය කෘතියේ උග්ගසේන සිටුපුත්හුගේ කතා වස්තුවේ ඇති අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කිරීමට සුදුසු යෙදුම් හැකිතාක් සොයා ලියන්න. | පහත දැක්වෙන යෙදුම්වල අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කරන්න.<br>"මඩුව විකුණන්නා නැත"<br>"එසේ වී නම් මම උන් හා එක් වෙමි" | පැවරුම් | කණ්ඩායම් ක්‍රියා | ” ” | නොගැලපෙන විවාහය කුටුම්භය තුළ මානසික පීඩනයට හේතු වේ. විමසන්න.(නියමිත පාඩම ඇසුරින්) |

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය අධ්‍යයන ඉලක්ක - සබරගමු පළාත් පාසල් - 2019

**විෂය.- සිංහල සාහිත්‍ය සංග්‍රහය** **වාරය. 1** **ශ්‍රේණිය 11**

| අනු අං | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | පැය ගණන කාලච්ඡේද | පැවරුම් හා විෂය භාහිර ක්‍රියාකාරකම් | තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න පත්‍ර | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණ සඳහා යොමු කිරීම | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 14.1 නියමිත කතා වස්තු කියවා විචාරයේ හා රසවින්දනයේ යෙදෙයි. | | 2<br>පැ1 මි. 20 | සද්ධර්ම රත්නාවලිය කතුවරයාගේ කතා කලාවේ සුවිශේෂ ලක්ෂණයකි "උපමා භාවිතයෙන් කතාව රසවත් කිරීම" ඒ සඳහා හැකිතාක් නිදසුන් සපයන්න. | තමන් වහන්සේගේ නුවණ නැමති හුණ දඬු අග හුන්නවුන් දැක".මෙහි උපමාව හා උපමේය වෙන් කොට දක්වන්න.<br>තමාගේ නුවණ උපමා කර ඇත්තේ කුමකට ද? | ප්‍රශ්නෝත්තර | " " | " " | සද්ධර්ම රත්නාවලිය කතුවරයාගේ බස් වහර පිළිබඳ අ.පො.ස.(සා.පෙ) විභාගය සඳහා අසා ඇති ප්‍රශ්න එකතුවක් සකසන්න ඒවා සඳහා පිළිතුරු සපයන්න. |
| | | | | 1<br>මි. 40 | උග්ගසේන සිටුපුත්හුගේ කතා වස්තුව පාඩම සහ කියවීමේ ක්‍රමයට කියවන්න. | දෙමාපිය අදහස්වලට විරුද්ධ වීම තමාගේ විනාශයට හේතු වීමට ඉඩ ඇත.<br>නියමිත පාඩම ඇසුරින් විමසන්න. | බුද්ධි කලම්බන | " " | " " | ඔබ උග්ගසේන සිටු පුත්‍රයා යැයි සිතන්න ඔබ ලබාගත් අත්දැකීම් ඇසුරින් ජීවිතය ජය ගැනීම සඟා ඔබගේ බාල සහෝදරයකු හට ලබාදෙන උපදෙස් මොනවා දැයි ලියා දක්වන්න. |
| 3 | 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි. | | 1<br>මි. 40 | කෝට්ටේ යුගයේ ලියවුණු සන්දේශ හා ඒවායේ කතුවරු , ගමන්මග හා අරමුණ ඇතුළත් ගොනුවක් පිළියෙල කරන්න. | හංස සන්දේශය ලියවුණු සාහිත්‍ය යුගය නම් කරන්න.<br>එම යුගයේ ලියවී ඇති වෙනත් සාහිත්‍ය කෘති කීපයක් නම් කරන්න. | ගවේෂණ | හංස සන්දේශය ගායනය සඳහා දක්ෂ සිසුන් කීප දෙනෙක් | කෝට්ටේ යුගයේ සාහිත්‍ය කේ.පී.ඩී වික්‍රමසිංහ සම්භාව්‍ය සිංහල කාව්‍යයේ විකාශනය<br>-සුචරිත ගම්ලත්. | හංස සන්දේශ කෘතියේ ගමන් මාර්ගය ලංකා සිතියමක ඇඳ දක්වන්න. |
| | | | | 1<br>මි. 40 | තාලානුරූපව ගායනය කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | දී ඇති පදවල අර්ථය ශබ්දකෝෂය භාවියෙන් සොයා ලියන්න.<br>සිහිලඹ,කුළින්, තළින් දිසෙයි, වල්පිට, ලඹදෙන, වනරඹ, රඹකැන්,මිහඹ, පොකුරු මී, මිණිමුතු, සිහිලැලී ය, පුල් විලීය, පවන'ද,සරේය,සදන'ලෙ විදුන්, | සකච්ඡා පැවරුම් | " " | " " | සුන්දර කෑරගල ගම්මානය යන මැයෙන් වාක්‍ය රචනයක් ලියන්න. |
| | | 13.2පද්‍ය පාදවල අර්ථ ලිහිල් බසින් ලියයි. | | 2<br>පැ1 මි. 20 | | පළමුවන හා දෙවන පද්‍ය ඇසුරින් අසන ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න<br>i. ගස්වල පිරී ඇති බව කියන පලතුරු වර්ග | | | | |

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය අධ්‍යයන ඉලක්ක - සබරගමු පළාත් පාසල් - 2019

**විෂය.- සිංහල සාහිත්‍ය සංග්‍රහය** **වාරය. 1** **ශ්‍රේණිය 11**

| අනු අං | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | පැය ගණන කාලච්ඡේද | පැවරුම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න පත්‍ර | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණ සඳහා යොමු කිරීම | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 04 | 14.0 සාහිත්‍ය නිර්මසාණ පරිශීලනයෙන් රසාස්වාදය හා චාරය කිරීමේ හැකියාව ප්‍රදශනය කරයි. | 13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි. | | 1<br>මි. 40 | සැළලිහිණි සන්දේශයේ කෑරගල වැනුම හා හංසසන්දේශයේ කෑරගල වැනුම පද්‍ය පන්ති දෙක අතර සමානකම් හා අසමානකම් අධ්‍යයනය කරන්න.<br><br>ඔබට සපයා ගත හැකි වෙනත් සන්දේශ කෘතීන් ගෙ එහි එන වෙහෙර වැනුම හා කෑරගල වෙහෙර වැනුම අතර වෙනස්කම් අධ්‍යයනය කරන්න.<br><br>සැළලිහිණි සන්දේශය සාහිත්‍ය පසුබිම පිළිබඳ තොරතුරු සොයන්න.<br><br>කෝට්ටේ යුගයේ ලියවුණු සන්දේහ කාව්‍ය 3 ක් තෝරා ගෙන ඒවායේ ආරම්භයේ සිට අවසානය දක්වා වූ වර්ණනා පෙළ ගස්වන්න.<br>ඔබ පෙළ ගැස්වූ වර්ණනා ලේඛනයේ පොදු ලක්ෂණ හඳුනා ගන්න.<br>එම පොදු ලක්ෂණ ඉදිරිපත් කරන්න. | මොනවා ද?<br>ii. සීතල දිය දහරා ගලා හැලෙන බව කියන්නේ කොහි සිට ද?<br>iii. ගෙවතුවල ඇතැයි කියන ගස් වර්ග දෙකක් ලියන්න.<br>iv. පළමු පද්‍ය දෙක කියවීමෙන් ඔබේ සිතට එම ගම්මානය පිළිබඳව හඅගෙන දේ ලියන්න.<br><br>සැළලිහිණි සන්දේශය කතුවර හිමි කවු ද?<br><br>එම කතුවර හිමියන් රචනා කළ සාහිත්‍ය කෘති දෙකක් නම් කරන්න.<br><br>සැළලිහිණි සන්දේශයේ අරමුණ කුමක් ද?<br><br>ලසමුවන පද්‍යයට අනුව බුදුන් වහන්සේගේ ශ්‍රී පාදය සමාන කර ඇත්තේ කුමකට ද?<br>2. කතරගම දෙවියන් හඳුන්වන වෙනත් නම් දෙකක් දක්වන්න.<br>3. කතරගම දෙවියන්ගේ ස්වරූපය පේළි 2 කින් විස්තර කරන්න.<br>4. 1 සිට 4 දක්වා ඇත් පද්‍යවල උපමා උපමේය වෙන්කර ලියන්න. | සාකච්ඡා<br><br>සාකච්ඡා<br>පැවරුම් | සැළලිහිණි සන්දේශය<br><br>” ” | මෙමියුරු පදැති සැළලිහිණිය සුචරිත ගම්ලත්<br><br>කෝට්ටේ යුගයේ සාහිත්‍ය කේ.පී.ඩී වික්‍රමසිංහ<br><br>” ” | හංස සන්දේශ කතුවරයා උපමා භාවිත කරමින් පද්‍ය රචනා කර ඇත. විමසන්න.<br>පද්‍ය පන්තියේ ඇති විවිධ උපමා ගොනු කරන්න.<br><br>සැළලිහිණි සන්දේශයේ දූතයාගේ ගමන් මාර්ගය ලංකා සිතියමක ඇඳ දක්වන්න. |

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය අධ්‍යයන ඉලක්ක - සබරගමු පළාත් පාසල් - 2019

**විෂය.-** සිංහල සාහිත්‍ය සංග්‍රහය     **වාරය. 1**     **ශ්‍රේණිය 11**

| අනු අං | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | පැය ගණන කාලච්ඡේද | පැවරුම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න පත්‍ර | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණ සඳහා යොමු කිරීම | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 1<br>මි. 40 | 5 සිට 8 දක්වා පද්‍යවලින් කියැවෙන පරිදි දූතයාට අතරමග දී හමුවන ස්ථාන පිළිබඳ විස්තරයක් ලියන්න. | 1. සපුමල් කුමාරයා යනු කවුරුන් ද?<br>2. සක් දෙව්ඳුගේ ඇතාගේ නම ලියන්න.<br>3. 7 වන කවියේ යුද්ධය සඳහා භාවිත කරන ආයුධ දෙකක් ලියන්න.<br>4. 8 වැනි වියට අනුව වැලි තලාව සමාන කර ඇත්තේ කුමකට ද? | | | | |
| | | | | 1<br>මි. 40 | "සොඳුරු ගමනක සොඳුරු දසුන්" යන මැයෙන් රචනයක් ලියන්න.(සැළලිහිණි සන්දේශයේ දූතයා ඔබ යයි සිතා අදාළ කරුණු සටහන් කරන්න.) | දී ඇති පදවල අර්ථය ලියන්න.<br>වයි, වග බැඳ,කොල්ලම්, සිසිලස රස, නිලමින්, පියල,සුමුටාන, පියුම් රා, දියහෙබ,<br>2. ඔලු'පුලැ'ඕලවල යන පදය විසන්ධි කරන්න.<br>3. ශ්‍රීයා කාන්තාවගේ පද්මරාග මාණික්‍යයෙන් බඳනා ලද රන් ආභරණවලට සමාන කර ඇත්තේ මොනවා ද? | සාකච්ඡා<br>පැවරුම් | " " | " " | සැළලිහිණි සන්දේශයේ හා හංස සන්දේශයේ මග වැනුම් සසඳන්න පංතියට ඉදිරිපත් කරන්න. |
| | | | | 2<br>පැ 1 මි. 20 | සැළලිහිණි සන්දේශයේ මග වැනුමේ එන ව්‍යංගාර්ථවත් යෙදුම් හා ධ්වනිතාර්තවත් යෙදුම් හැකිතාක් උපුටා ලියන්න. | ව්‍යංගාර්ථවත් බස්වහර හා ධ්වනිතාර්තවත් බස් වහර භාවිතය පිළිබඳ සැළලිහිණ කතුවරයා දැක්වූ කුසලතාව කෙතෙක් දුරට සාර්ථක දැයි විමසන | සාකච්ඡා<br>පැවරුම් | " " | " " | ස්වභාව සෞන්දර්ය වර්ණනයේදී සැළලිහිණ කතුවරයා අනෙකුත් සන්දේශ කතුවරුන්ට වඩා ඉදිරියෙන් සිටී. අධ්‍යයනය කරන්න. |
| | | | | 2<br>පැ 1 මි. 20 | සැළලිහිණියේ මග වැනුමේ ඇති අනුප්‍රාසවත් පද හා සාර්ථක එළිවැට ලක්ෂණ උපුටා ලියන්න | එළිවැට හා අනුප්‍රාසවත් පද භාවිතයේ දී සැළලිහිණි කතුවරයා කෙතෙක් දුරට සාර්ථක වී ඇත්දැයි විමසන්න. | සාකච්ඡා<br>පැවරුම් | " " | " " | ඉහත මාතෘකාව යටතේ පන්ති රැස්වීමේදී කතාවක් කරන්න. |
| | | | | 1<br>මි. 40 | සැළලිහිණියේ එන වනාන්තරය ඇතුළුව පරිසරයේ චමත්කාර ජනක ලක්ෂණයන් අධ්‍යඨයනයකරන්න. | මග වැනුමේ එන සුමුටාන වනයේ ස්වභාවය පිළිබඳව විස්තරයක් ලියන්න | පැවරුම්<br>සංවාද<br>සාකච්ඡා | " " | " " | |

# 2 වාරය

**විෂය.- සිංහල සාහිත්‍ය සංග්‍රහය**

**ශ්‍රේණිය 11**

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය අධ්‍යයන ඉලක්ක - සබරගමු පළාත් පාසල් - 2019

**විෂය.-** සිංහල සාහිත්‍ය සංග්‍රහය **වාරය.** 2 **ශ්‍රේණිය** 11

| අනු අංං | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | පැය ගණන කාලච්ඡේද | පැවරුම් හා විෂය භාහිර ක්‍රියාකාරකම් | තකෂේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න පත්‍ර | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණ සඳහා යොමු කිරීම | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 05 | 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි. | | 1 මි. 40 | පෙළ පොතේ නියමිත ජන කවි පසුබිම හඳුනාගෙන විස්තර කරයි. | 1. ඔබට නියමිත ජන කවි වර්ගය නම් කරන්න.<br>2 ඔබ අසා ඇති විවිධ වර්ගයේ ජන කවි සොයා ලියන්න.(එක් වර්ගයකින් 3 බැගින් ප්‍රමාණවත් වේ.)<br>3. ගොවීන් ගොවිතැන් පිණිස හේන් එළි පෙහෙළි කරන්නේ කිනම් මාසයේ ද?<br>4. හේනේ කුරක්කන් ඉතා සරුවට ඇති බව කියැවෙන කවිය උපුටා ලියන්න.<br>5 දී ඇති පදවල අර්ථය ඉදිරියෙන් ලියන්න.<br>සුරක්කන්, ලොවගම, නරක්කන්,කණු මදු | | | ජන කවි 1 ජා අ.අ.<br>සිව්පද හා සමාජය නන්දදේව විජේසේකර | පෙළ පොතේ නියමිත පාඩම ඇසුරින් ජන කවියා මුහුණ පෑ විවිධ අභියෝග විස්තර කරන්න. |
| | | | | 1 මි. 40 | නියමිත ජන කවි හඬ නගා තාලානුරූපව ගායනා කරයි. අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | කුරක්කන් වපුරා පැළ හට ගැනීමට ගත වන කාලය දින කීය ද? | | | | |
| | | 13.3 | | 1 මි. 40 | පෙළ පොතේ ඇති ජන කවිවල දක්නට ලැබෙන සංස්කෘතික ලක්ෂණ සොයන්න. | ගොවීන් කුරක්කන් වැපිරීමට පළමුව සුදානම් වීම පිළිබඳව හෙළි වන විශ්වාසයන් ලියන්න.<br>හේනේ පැළේ මා විදිනා සුරක්කන්" මෙම පද්‍ය පාදයේ තේරුම ලියන්න. | සාකච්ඡා පැවරුම් ප්‍රශ්නෝත්තර | සිංහල ජන කවි සංග්‍රහය | | |
| | | | | 1 මි. 40 | ජන කවියාගේ බසවහර අව්‍යාජත්වය ප්‍රතිනිර්මාණය කරන ආකාරය විමසන්න. | පැරණි සංස්කෘතියේ දක්නට ලැබෙන ලක්ෂණයකි නෑනා මස්සිනා විවාහයඑයට නිදසුන් පද්‍ය පංතියෙන් සොයා ලියන්න. | සාකච්ඡා පැවරුම් ප්‍රශ්නෝත්තර | " " | " " | විවිධ ජන සංස්කෘතික ලක්ෂණ හෙළි කරන ජන කවි එකතුවක් පිළියෙල කරන්න. |

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය අධ්‍යයන ඉලක්ක - සබරගමු පළාත් පාසල් - 2019

**විෂය.-** සිංහල සාහිත්‍ය සංග්‍රහය **වාරය. 2** **ශ්‍රේණිය 11**

| අනු අං | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | පැය ගණන කාලච්ඡේද | පැවරුම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න පත්‍ර | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණ සඳහා යොමු කිරීම | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 06 | 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි. | | 1<br>මි. 40 | අපට වැසිකිලියක් කෙටි කතාවේ කතුවරයා හා ඔහුගේ වෙනත් කෘති පිළිබ1දව තොරතුරු එක් රැස් කරන්න. | අපට වැසිකිලියක් කෙටි කතාවේ කතුවරයාගේ නම ලියන්න.<br>එම කතුවරයා විසින් රචිත වෙනත් සාහිත්‍ය කෘති 3 ක නම් ලියන්න.<br>කෙටි ක.තවේ ඇතුළත් ප්‍රධාන චරිත මොනවා ද? | පැවරුම් ගවේෂණ | පුංචි පැළේ ගස වෙනා පුංචිරාළ නවකතාව නොනිමි සිත්තම(කෙටි කතා සංග්‍රහය) කේ.ජයතිලක | බවතිමිර පෙරවදන වහල්ලු ප්‍රශ්ථාවනාව කෙටි කතා නිර්මාණය,අධ්‍යයනය හා මුලධර්ම - රංජිත් ධර්මකීර්ති. | පිටුව අංක 100 හි එන අක්කා හා මල්ලී අතර ඇතිවන සංවාදය ගොඩ නගන්න. පංතියට ඉදිරිපත් කරන්න. |
| | | | | 1<br>මි. 40 | කෙටි කතාවක් හා නව කතාවක් කියවා එහි ඇත් වෙනස් කම් ලියන්න. | නියමිත කෙටි කතාවේ කෙටි කතා ලක්ෂණ පෙන්වා දෙන්න.<br>අදාළ නිදසුන් කෙටි කතාවෙන් උපුටා ලියන්න. | ගවේෂණ නිරීක්ෂණ විවෘත ග්‍රන්ථ | පුංචි පැළේ ගස වෙනා පුංචිරාළ නවකතාව නොනිමි සිත්තම(කෙටි කතා සංග්‍රහය) කේ.ජයතිලක | බවතිමිර පෙරවදන වහල්ලු ප්‍රශ්ථාවනාව කෙටි කතා නිර්මාණය,අධ්‍යයනය හා මුලධර්ම - රංජිත් ධර්මකීර්ති | |
| | | | | 1<br>මි. 40 | කෙටි කතාව කියවා අවස්ථා ,සිද්ධි හා චරිත හඳුනා ගනී. | පහත සඳහන් ප්‍රකාශයන්ට අවස්ථා සම්බන්ධය ලියන්න.<br>" දැන් ඉතින් හවස් වෙලානෙ දැන් වත් ඉතින් වරෙන්"<br>මෙම ප්‍රකාශය කරන්නේ කවු ද?<br>එන්නට කියන්නේ කුමක් පිණිස ද?<br>මෙවැනි අවස්ථා හැකිතාක් ලියා දක්වන්න.<br>ඒවා ඇසීමට ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් සංවිධානය කරන්න | ප්‍රශ්නෝත්තර ක්‍රියාකාරකම් | පුංචි පැළේ ගස වෙනා පුංචිරාළ නවකතාව නොනිමි සිත්තම(කෙටි කතා සංග්‍රහය) කේ.ජයතිලක | බවතිමිර පෙරවදන වහල්ලු ප්‍රශ්ථාවනාව කෙටි කතා නිර්මාණය,අධ්‍යයනය හා මුලධර්ම - රංජිත් ධර්මකීර්ති | අපට වැසිකිලියක් කෙටි කතාවේ වැදගත් සිද්ධි අනුපිළිවෙළට පෙළ ගස්වන්න. |

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය අධ්‍යයන ඉලක්ක - සබරගමු පළාත් පාසල් - 2019

**විෂය.-** සිංහල සාහිත්‍ය සංග්‍රහය **වාරය.** 2 **ශ්‍රේණිය** 11

| අනු අං | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | පැය ගණන කාලච්ඡේද | පැවරුම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න පත්‍ර | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණ සඳහා යොමු කිරීම | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 07 | 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 14.4නූතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි. | | 2<br>පැ1 මි.20 | කෙටි කතාවේ චරිත හා සිද්ධි විචාරය කරයි. | කෙටි කතාවේ කතකයාගේ චරිත ලක්ෂණ නුගත් අව්‍යාජත්වය නිරූපණය කරයි<br>ඊට සුදුසු නිදසුන් උපුටා ලියන්න. | සංකල්ප සිතියම සාකච්ඡා | නොනිමි සිත්තම(කෙටි කතා සංග්‍රහය) | වහල්ලු කෙටි කතා සංග්‍රහය | |
| | | | | 1.<br>මි 40 | කෙටි කතාවේ භාෂාව සාර්තකත්වයට ඉවහල් වූ අයුරු අධ්‍යයනය කරන්න. | "කලක් තිස්සේ පුරුදු වූ ක්‍රියවෙකින් අත මිදීම අපහස් කාර්යයකි" අපට වැසිකිළියක් කෙටි කතාව ඇසුරින් විමසන්න. | පැවරුම් සාකච්ඡා ක්‍රියාකාරක ම් | " " | " " | අපට වැසිකිළියක් කෙටි කතාව භූමිකා රංගනයකින් ඉදිරිපත් කරන්න . |
| | | | | 2<br>පැ1 මි.20 | ගී ද මෝපසාං කතුවරයා පිළිබඳව සොයන්න.<br>එම තොරතුරු ඇතුළත් කොට බිත්ති පුවත් පතට ලිපියක් ලියන්න. | ගීද මෝපසාං කිනම් ජාතිකයෙක් ද?<br>ඔහු විසින් රචිත සාහිත්‍ය නිර්මාණ අතර නව කතා හා කෙටි කතා ගණන ලියන්න<br>දියමන්ති මාලය කෙටි කතාව සිංහලට පරිවර්තනය කළේ කවුරුන් ද? | සාකච්ඡා | දියමන්ති මාලය කෙටි කතා සංග්‍රහය | මැණික් සාමි සහ තවත් කතා - එදිරිවීර සරච්චන්ද්‍ර<br>ඒ.පී ගුණරත්ත<br>ඉටිබෝලය හා තවත් කතා<br>කේ.පී කරුණාතිලක. | දියමන්ති මාලය කෙටි කතා සංග්‍රහයේ එන නෙත් කෙටි කතාවක් උපුටා ලියන්න. |
| | | | | 1.<br>මි 40 | පරිවර්තිත කෙටි කතාවක් වශයෙන් දියමන්ති මාලය කෙටි කතාවේ ලක්ෂණ හඳුනා ගනියි. | පරිවර්තිත කෙටි කතාවක් හඳුනා ගැනීමට පහසු ලක්ෂණ 2 ක් ලියන්න | | " " | | ලොයිසල් මහතාගේ චරිතය පිළිබඳව ඔබට දැනෙන දේ ලියන්න. |

# 3 වාරය

**විෂය.- සිංහල සාහිත්‍ය සංග්‍රහය**

**ශ්‍රේණිය 11**

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය අධ්‍යයන ඉලක්ක - සබරගමු පළාත් පාසල් - 2019

**විෂය.-** සිංහල සාහිත්‍ය සංග්‍රහය **වාරය. 3** **ශ්‍රේණිය 11**

| අනු අං | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | පැය ගණන කාලච්ඡේද | පැවරුම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න පත්‍ර | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණ සඳහා යොමු කිරීම | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 08 | 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි. | | 1 මි. 40 | කොළඹ යුගයේ කවියකු වශයෙන් මහගමසේකර පිළිබඳව ලියවුණු නිර්මාණ එකතුවක් පිළියෙල කරන්න. | මහගමසේකර කවියාගේ උපන් වර්ෂය ,අධ්‍යාපනය හා සාහිත්‍ය සේවාව පිළිබ1ද බිත්ති පුවත් පතට ලිපියක් ලියන්න. | සාකච්ඡා ගවේෂණ | ප්‍රබුද්ධ කාව්‍ය සංග්‍රහය<br>ගීතය ඇ.ළත් හඬ පටයක් | විමල් දිසානායක - නව කවි සරණිය | මහගමසේකර සූරීන් විසින් රචිත කාව්‍ය නිර්මාණ එකතුවක් පිළියෙල කරන්න.. |
| | | | | 1 මි. 40 | දෑතේ කරගැට ගීතය ඇතුළත් හඬ පටයට සවන් දෙයි තාල තබමින් ගායනයේ යෙදෙයි | ගීතයෙන් කියැවෙන්නේ කිනම් කරුණක් පිළිබඳව ද?<br>පියාගේ අරමුණ වී ඇත්තේ තම දරුවා පිළිබඳ කිනම් හැඟීමක් ද?<br>පියාගේ ගත වෙහෙස නැති වීමට හේතු වී ඇත්තේ කුමක් ද?<br>තම දරුවාට උපන් දේශය පිළිබඳව අභිමානයක් ජනනය කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ප්‍රකාශයන් මොනවා ද? | සාකච්ඡා | " " | " " | |
| | | | | 1 මි. 40 | දෑතේ කරගැට ගීතය පිළිබඳ විචාරයක යෙදෙයි ජාතිකාභිමානය ජනනය කරවන වෙනත් රචකයින්ගේ නිර්මාණ එකතුවක් කරන්න. | එම ගීත හා දෑතේ කරගැට ගීතයේ භාෂාව යොදාගෙන ඇති ආකාරය පිළිබඳව වෙනස් කම් අධ්‍යයනය කරන්න. | සාකච්ඡා | " " | " " | දේශාභිමානී ගීත ගායනා වැඩසටහනක් පැවැත්වීම |
| | | | | 1 මි. 40 | දෑතේ කරගැට ගීතයෙන් මතුකෙරෙන කවියාගේ ප්‍රාර්ථනා මොනවාදැයි ලියා දක්වන්න | පෙළ පොත පිටුව 124 අභ්‍යාස 3 සඳහා පිළිතුරු ලියන්න. | | | | |
| 09 | 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි. | | 1 මි. 40 | රත්නශ්‍රී විජේසිංහයන්ගේ සාහිත්‍ය සේවාව අගයමින් බිත්ති පුවත් පතට ලිපියක් ලියන්න. | රත්න ශ්‍රී විජේසිංහයන් රාජ්‍ය සේවාව කළ ආයතන මොනවා ද?<br>ඔහුගේ ප්‍රථම කාව්‍ය සංග්‍රහය නම් කරන්න.<br>ඔහු විසින් රචිත රාජ්‍ය සම්මාන ලත් නිර්මාණ 5 ක් ලියන්න | | ගීතය ඇ.ළත් හඬ පටයක් | විමල් දිසානායක - නව කවි සරණිය | |

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය අධ්‍යයන ඉලක්ක - සබරගමු පළාත් පාසල් - 2019

**විෂය.- සිංහල සාහිත්‍ය සංග්‍රහය** **වාරය. 3** **ශ්‍රේණිය 11**

| අනු අං | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | පැය ගණන කාලච්ඡේද | පැවරුම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න පත්‍ර | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණ සඳහා යොමු කිරීම | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | වස්සානය පද්‍ය පංතිය රචනා කිරීමේ සාහිත්‍ය පසුබිම විස්තර කරන්න. | | | | |
| | | 14.5 නූතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි. | | 2<br>පැ1 මි 20 | වස්සානය පද්‍යයේ කතුවරයාගේ අපූර්වත්වය පෙන්නුම් කෙරෙන තැන් උපුටා ලියන්න. | කුබුක් අතු වතුර අත ග ගා නැමිලා දියට" යන්නෙන් අදහස් කෙරෙන සිදුවීම කුමක් ද?<br>කවියා පාඨකයා වෙත ලබා දෙන ජීවනක උපදේශය පෙන්වා දෙන්න. | පැවරුම් සාකච්ඡා | වස්සානය පද්‍ය ඇතුළත් හඬ පටයක් | විමල් දිසානායක - නව කවි සරණීය | රත්න ශ්‍රී විජේසිංහයන් විසින් රචිත කාව්‍ය නිර්මාණ එකතුවක් පිළියෙල කරන්න. |
| | | | | 1<br>මි40 | වස්සානය කතුවරයා අජීවී වස්තූන්ට සජීවීත්වය ආරෝපණය කර ඇති ආකාරය පෙන්වා දෙන්න. | පෙළ පොත පිටුව 127 අභ්‍යාස අංක 4 ට පිළිතුරු ලියන්න. | පැවරුම් සාකච්ඡා | " " | " " | වස්සානය පද්‍ය පංතිය පිළිබඳව පංති රැස්වීමේදී විචාරාත්මක කතාවක් ඉදිරිපත් කිරීමට කරුණු එක් රැස් කරන්න. |